රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2023

මගේ අංකය : EST-6/07/AGM/1010
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.06.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ 15 පරිශිෂ්ටයේ බැඳුම්කර ආකෘතිය සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී පරිච්ඡේදයේ 16:6 උප වගන්තිය අනුව තාවකාලික හෝ ස්ථිර නොකරන ලද නිලධරයෙකු හට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදෙන අවස්ථාවේ දී 9 වැනි පරිශිෂ්ටයේ ගිවිසුමට අමතරව, XV පරිච්ඡේදයේ 4:2 උප වගන්තියේ සඳහන් පරිදි බැඳුම්කරයකට ද එළඹිය යුතු ය.

03. ඒ අනුව, ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ 15 වැනි පරිශිෂ්ටය ලෙස ඇතුළත් බැඳුම්කරයේ "සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධරයන් විසින් අත්සන් කරනු ලබන බැඳුම්කරයේ ආකෘතිය" ලෙස සඳහන් මාතෘකාව **"සම්පූර්ණ වැටුප් සහිත/වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධරයන් අත්සන් කළ යුතු බැඳුම්කරයේ ආකෘතිය"** ලෙස සංශෝධනය කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk